# Career Planning Roadmap

## උසස් පෙළින් පසු ඔබට අධ්‍යාපනය ලැබීමට ඇති විවිධ මාර්ග




Trainer: Mohamed Rushdi Hadhi

## හැඳින්වීම - Introduction

ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ උසස් පෙළින් පසු ඉගෙනීමට බලාපොරොත්තු වන අයෙකුට ප්‍රධාන වශයෙන් විකල්ප 7ක් පවතී. ඒවා පහත පරිදි වර්ගීකරණය කළ හැකිය.

## 1. රජයේ විශ්වවිද්‍යාල උපාධි පාඨමාලා (Government University Degree Programs)

- මෙහි විශේෂත්වය වනුයේ සම්පූර්ණයෙන්ම නොමිලේ (Free) අධ්‍යාපනය ලැබීමට අවස්ථාවක් ලැබීම වේ.
- ශ්‍රී ලංකාව පුරා ඇති රජයේ විශ්වවිද්‍යාල ප්‍රමාණය 16කි.
- මෙහි වාසි වනුයේ ඉහළ පිළිගැනීමක් තිබීම, විවිධ විෂය ක්ෂේත්‍ර (වෛද්‍ය, ඉංජිනේරු පමණක් නොව නීතිය, තොරතුරු තාක්ෂණය, කෘෂිකර්මය ආදී බොහෝ ක්ෂේත්‍ර) පැවතීම.

University of Colombo

University of Peradeniya

University of Sri Jayewardenepura

University of Kelaniya

University of Moratuwa

University of Jaffna

University of Ruhuna

Eastern University, Sri Lanka

South Eastern University of Sri Lanka

Rajarata University of Sri Lanka

Sabaragamuwa University of Sri Lanka

Wayamba University of Sri Lanka

Uva Wellassa University of Sri Lanka

The Open University of Sri Lanka

University of the Visual and Performing Arts

Gampaha Wickramarachchi University of Indigenous Medicine

University of Vavuniya

## 2. රජයේ උසස් අධ්‍යාපන ආයතන (Government Higher Education Institutes)

- මෙහි විශේෂත්වය වනුයේ මෙහිදී පිරිනමනු ලබන්නේ උපාධියක් වෙනුවට HND (Higher National Diploma) හෝ ඩිප්ලෝමා පාඨමාලා වේ.
- ආයතන : **Sri Lanka Institute of Advanced Technological Education (SLIATE)**

  **Institute Of Technology (NDT)**

  **Institute of Engineering Technology, Sri Lanka (NDES)**

## 3. රජයේ වෘත්තීය පුහුණු ආයතන (Government Vocational Training Institutes)

- මෙහි විශේෂත්වය වනුයේ ප්‍රායෝගික පුහුණුව මත පදනම් වූ සහතික පත්‍ර සහ ඩිප්ලෝමා පාඨමාලා මෙම ආයතන මගින් පිරිනැමීමයි. (NVQ)



ආයතන : **National Apprentice and Industrial Training Authority (NAITA)**

**Ceylon German Technical Training Institute**

**Vocational Training Authority**

**University of Vocational Technology**

## 4. රජයේ විශ්වවිද්‍යාල බාහිර උපාධි (External / Distance Degrees)

- මෙහි විශේෂත්වය වනුයේ රජයේ විශ්වවිද්‍යාලයකින් උපාධිය පිරිනමන නමුත්, දේශන සඳහා සෘජුව සහභාගී නොවී හැදෑරිය හැකි උපාධි වේ.
- එමෙන්ම මේ සඳහා යම් කිසි මුදලක් (Fee) ගෙවීමට සිදුවේ.

## 5. පෞද්ගලික ආයතනවල HND හෝ ඩිප්ලෝමා (Private HND/Diploma)

- මෙහි විශේෂත්වය වනුයේ පෞද්ගලික විශ්වවිද්‍යාලයකින් කෙලින්ම උපාධියකට ඇතුළත් වීමට පෙර හෝ මුදල් කළමනාකරණය කරගැනීමට ඩිප්ලෝමා මට්ටමෙන් ආරම්භ කිරීම. පසුව එය උපාධිය දක්වා "Top-up" කළ හැකිය.

## 6. පෞද්ගලික විශ්වවිද්‍යාල උපාධි (Private University Degrees)

- **වර්ගීකරණය:**
  - ලංකාවේ පෞද්ගලික විශ්වවිද්‍යාල (UGC අනුමත).
  - විදේශීය විශ්වවිද්‍යාල සමඟ සම්බන්ධ වී පවත්වන පාඨමාලා (Affiliated Degrees).
- මේ සඳහා රජයේ පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය (Interest-free Loan Scheme) භාවිතා කළ හැකිය.

## 7. වෘත්තීය සුදුසුකම් (Professional Qualifications)

- මෙහි විශේෂත්වය වනුයේ යම් නිශ්චිත වෘත්තියකට අදාළව ජාත්‍යන්තරව පිළිගත් සහතික ලබාගැනීම.
- **උදාහරණ:**
  - **කළමනාකරණය/අලෙවිකරණය:** CIM, SLIM.
  - **ගිණුම්කරණය:** CIMA, ACCA, CA Sri Lanka, CMA.
  - **මානව සම්පත්:** CIPM.
  - **තොරතුරු තාක්ෂණය:** විවිධ වෘත්තීය සහතික (Cisco, Microsoft ආදිය).

## 8. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය (Open University)

- Z-score එක මදි වුවත් මුදල් ගෙවා උපාධියක් ලබාගත හැකි රජයේ ආයතනයකි. මෙහි ඉතා නම්‍යශීලී (Flexible) අධ්‍යාපන ක්‍රමයක් ඇත.

## රජයේ පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය (Interest-Free Loan Scheme)

- මෙය පෞද්ගලික විශ්වවිද්‍යාලයකට යාමට මුදල් අපහසුතා ඇති සිසුන්ට රජය ලබා දෙන විසඳුමයි.
- අදාළ වසරේ උසස් පෙළ සමත් වී, රජයේ විශ්වවිද්‍යාලයකට තේරී පත් වීමට නොහැකි වූ සිසුන් මේ සඳහා සුදුසුකම් ලබයි.
- මෙම ණය මුදල ලබා දෙන්නේ රජය විසින් අනුමත කරන ලද පෞද්ගලික ආයතන ලැයිස්තුවකට පමණයි (උදා: SLIIT, NSBM, CINEC, Horizon Campus ආදී ආයතන 15-17 ක් පමණ).
- මෙහි වාසිය වන්නේ උපාධිය හදාරන කාලය තුළ කිසිදු මුදලක් ගෙවිය යුතු නැත. උපාධිය අවසන් කර රැකියාවකට ගිය පසු වසර කිහිපයක් ඇතුළත වාරික වශයෙන් ණය මුදල පියවිය හැකිය.

## රජයේ විශ්වවිද්‍යාල සාමාන්‍ය උපාධි සහ බාහිර උපාධි අතර ඇති වෙනස

- බොහෝ දෙනෙක් පටලවා ගන්නා කරුණක් වන්නේ සාමාන්‍ය (Internal) සහ බාහිර (External) උපාධි අතර ඇති වෙනසයි.
- **සාමාන්‍ය උපාධි:** Z-score එක මත රජයේ විශ්වවිද්‍යාල සඳහා තේරී පත්ව යන සිසුන් මේ සඳහා සුදුසුකම් ලබයි. එමෙන්ම මෙහි අධ්‍යාපනය නොමිලේ වන අතර, එහි විශ්වවිද්‍යාල ජීවිතය (Sports, Clubs) උපරිමයෙන් විඳිය හැකිය.
- **බාහිර උපාධි:** මොවුනට Z-score එක මදි වුවත් ඕනෑම අයෙකුට සුළු මුදලක් ගෙවා ලියාපදිංචි විය හැකිය. මෙහිදී ඔබ විශ්වවිද්‍යාලයට දිනපතා යා යුතු නැත (Distance Learning). විභාග පමණක් රජයේ විශ්වවිද්‍යාල වල පවත්වන අතර සහතිකය රජයේ විශ්වවිද්‍යාලයකින්ම ලැබේ.

## UGC Handbook එක පරිශීලනය කිරීමේ වැදගත්කම

- මෙහි ඇතැම් උපාධි සඳහා (උදා: Business Statistics, GIS, Fashion Design) ඔබ A/L වලට කර තිබිය යුතු විෂයන් නිශ්චිතව දක්වා ඇත. ඔබ වැරදි විෂය සංකලනයක් කර ඇත්නම් එම උපාධියට අයදුම් කළ නොහැක. එමෙන්ම ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල වලට තේරීමේදී ඔබේ දිස්ත්‍රික්කය මත Z-score අගය වෙනස් වේ. කොළඹ දිස්ත්‍රික්කයට වඩා දුෂ්කර දිස්ත්‍රික්ක වල සිසුන්ට අඩු Z-score අගයකින් රජයේ විශ්වවිද්‍යාල සඳහා ඇතුළත් විය හැකිය.

